# රක්ඛිතාකන්ද පුරාණ ලෙන් විහාරයේ සිතුවම්වල දක්නට ඇති යටත්විජිත ලක්ෂණ

ජේ.එම්.එස්. ප්‍රබුද්ධ

පුරාවිද්‍යා අධ්‍යනාංශය,කැලණිය විශ්වවිද්‍යාලය

saripr abuddha@gmail.com

ප්‍රමුඛ පද: රක්ඛිතාකන්ද, ලෙන් විහාරය, චිත්‍ර, බ්‍රිතාන්‍ය ලක්ෂණ

## හැඳින්වීම

කොනප්පු බණ්ඩාර කුමරු ක්‍රිස්තු වර්ෂ 1594 දී පළමුවැනි විමලධර්මසූරිය නමින් උඩරට රජ වීමත් සමඟ උඩරට නව රජ පෙළපතක් බිහිවේ. ඒ වන විට උඩරට කඳුකර ප්‍රදේශය හැර වෙරළබඩ තීරයේ රාෂ්ට්‍ර බලය තිබුණේ බටහිර ජාතියක් වූ පෘතුගීසීන් යටතේ ය. ලංකාවේ අවසාන රාජධානිය වූ කන්ද උඩරට රාජධානිය අනුරාධපුර යුගයට පසු ලංකාවේ දීර්ඝතම කාලයක් පැවති රාජධානිය වේ. උඩරට ප්‍රදේශය පහසුවෙන් හඳුනාගත හැකි වන්නේ දිවයිනේ මැද පිහිටි කඳුකර ප්‍රදේශය වශයෙනි. වේගිරිය, බේරුවල, බඹරගල, ගෝණවත්ත, මොළගොඩ යන ස්ථානවල දී හමුවී ඇති බ්‍රාහ්මී ශිලාලේඛන විග්‍රහ කර බැලීමේදී මහනුවර හෙවත් කන්ද උඩරට ප්‍රදේශ හා එහි උප නගර ක්‍රිස්තු වර්ෂ ආරම්භය වන විට ජනාවාසකරණයට ලක් වී ඇති බවට සාධක වෙයි. පළමුවැනි විමලධර්මසූරිය නම් සිංහල රජුගෙන් ආරම්භ වන මහනුවර රාජධානිය අවසන් වන්නේ ශ්‍රී වික්‍රම රාජසිංහ නම් වඩිග රජු ඉංග්‍රීසීන්ට හසුවීමෙනි.සිංහල රජවරුන් හා බෞද්ධාගම වැළඳ ගත් වඩුග රජවරුන් විසින් බුදුදහම නංවාලීම සඳහා වෙහෙර විහාර ඉදි කිරීම ආදී කාර්යයන් රාශියක් මේ සමයේ ද සිදුකර ඇත.

මහින්දාගමනයත් සමඟ මෙරට ප්‍රධාන ආගම බවට බුද්ධාගම පත්විය. ඒ අනුව රාජානුග්‍රහය මත මෙන්ම ප්‍රාදේශීය අනුග්‍රහය මත දිවයින පුරා වෙහෙර විහාර ඉදි විය. මුලින්ම ගල්ගුහා ආදී ස්ථාන පිරිසිදු කර ආරාම වශයෙන් භික්ෂූන් උදෙසා පූදානම් කර තිබේ. ඒවා ලෙන් ආරාම වශයෙන් හඳුන්වනු ලබයි. පසුකාලය වනවිට කටුමැටි ගසා ගොඩනැගිලි ඉදි කිරීම සිදු කර තිබේ. කුමන හෝ විහාරයක බුදු සිරිතට සම්බන්ධ සිද්ධි දාමයක් ඒ ඒ යුගයට අනුකූල වන ලෙස සිතුවම් කර තිබීම දක්නට ලැබේ. යටත්විජිත යුගයේදී එනම් බටහිර ජාතීන් ගේ ආගමනයත් සමග මෙරට විහාර කර්මාන්ත වලට පවා බටහිර ආභාෂය ලැබී තිබේ. එමනිසා මේ පර්යේෂණයේ අරමුණ වූයේ ප්‍රසිද්ධ ලෙන් විහාරයක් වන රක්ඛිතාකන්ද ලෙන් විහාරයේ චිත්‍රවලට ලැබී ඇති බටහිර ආභාෂය පිළිබඳ සොයා බැලීම යි. මොනරාගල දිස්ත්‍රික්කයේ ඇල්ල වැල්ලවාය කොට්ඨාශයේ රාවණා ඇල්ල පිහිටි ස්ථානයේ සිට 8Km පමණ දුර ගෙවා මෙම ස්ථායට ළඟාවිය හැකිය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස අධ්‍යයනයන්හි යොදාගනු ලබන විධි ක්‍රම කිහිපයක් භාවිත කරනු ලැබීය. මහනුවර යුගයේ චිත්‍ර පිළිබඳව ගුණාත්මක අධ්‍යයනයක් සඳහා මුලින්ම සාහිත්‍ය

මූලාශ්‍ර පිළිබඳ විමර්ශනයක් සිදු කරනු ලැබීය. ඉන්පසු ලෙන් විහාරයට ගොස් ප්‍රතිමා ගෘහයේ ඇති සිතුවම් ඉතා හොඳින් නිරීක්ෂණය කිරීමෙහි යෙදුණි. මෙහිදී සාකච්චාවට බඳුන් කරන්නේ මේ විහාරස්ථානයේ සිතුවම් කර ඇති චිත්‍ර පිළිබඳව පමණි. මහනුවර යුගයේ සිතුවම් කලාව පහතරට ප්‍රදේශ අනුව ද වෙනස්කම්වලට ලක්වන නිසා එම යුගයේ චිත්‍ර පිළිබඳ පුළුල් විග්‍රහයක් කිරීම මෙහිදී අනවශ්‍ය වේ. දත්ත විශ්ලේෂණයේදී මහනුවර යුගයේ සිතුවම් කලාව පිළිබඳ පොත්පත් ඇසුරින් හා සහභාගීත්ව නිරීක්ෂණ තුළින් අධ්‍යනය කර ඒ අනුව මෙහි චිත්‍ර කලාවට බලපා ඇති යටත්විජිත ලක්ෂණ පිළිබඳව අධ්‍යනයක නියැලුණි. එසේම විහාරවාසී ස්වාමීන් වහන්සේ හා කතිකා කර තොරතුරු අසා දැන ගන්නට ලැබුණු අතර අවශ්‍ය ඡායාරූප පුරාවිද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුව චිත්‍රවලට වන හානි අවම වන සේ වග බලා ගනිමින් ලබා ගැනීමට කටයුතු කළේය.

**සාකච්ඡාව**

අද මෙන් සන්නිවේදන පහසුකම් නොතිබූ අතීතයේ ජනතාවට බොහෝ අදහස් ලබා දුන්නේ ජනතාව වඩාත් සංවේදී වන ක්‍රමවේදයන් හරහා ය. බුදු සිරිත හා බුදු සිරිත සම්බන්ධ බොහෝ සිදුවීම් ඇතත් ඒවා වචනයෙන් විස්තර කිරීමට වඩා ඒ පිළිබඳ අදහස් ජනතාවට ලබාදීමට මූලාශ්‍රය කරගත්තේ පිළිම ගෙය තුළ චිත්‍ර ඇඳීමයි. එතුළින් වඳින්න පුදන්න එන ජනතාවට ලොකු අදහසක් ඉතා සරලව අඩු කාලයකින් ලබාදීමේ හැකියාව ලැබුණි. මේ අනුව ලංකාවේ අනුරාධපුර යුගයේ පටන් රාජධානි මාරුවීමත් සමඟ චිත්‍ර සම්ප්‍රදායන් ද කිහිපයක් විය.

මහින්ද සෝමතිලක මහතාගේ අදහසට අනුව ලංකාවේ චිත්‍ර කලාව අවධි පහකට බෙදේ. ඒවායින් පස්වැනි 18 හා 19 වැනි සියවස් අතර වූ මහනුවර චිත්‍ර සම්ප්‍රදායට රක්ඛිතාකන්ද ලෙන් විහාරයේ චිත්‍ර අයත් වෙයි. මීට පෙර අවධියෙන් සමග යම් යම් සමාන ලක්ෂණ තිබුණද මහනුවර චිත්‍ර සම්ප්‍රදාය ආවේනික ලක්ෂණ රාශියකින් සමන්විත වේ. මෙම විහාරය වළගම්බා රජ සමයේ ඉදි වී ඇතත් ලෙන් විහාරයේ අද ද දක්නට ඇති චිත්‍ර මහනුවර යුගයේදී චිත්‍රයට නගා ඇත. 1886 දහවැනි මස 22 වැනි දින අවසන් වරට විහාරය ප්‍රතිසංස්කරණය කළ බවට එහි ඇති සටහනකින් දැක්වේ. ඒ අනුව එ කල යටත්විජිත සමය වන අතර එනිසා යටත්විජිත ලක්ෂණ ද චිත්‍රවලට බලපා ඇතිබවට චිත්‍ර පිළිබඳ විමර්ශනයෙන් පෙනේ. ලෙන් විහාර චිත්‍ර තුළින් පිළිබිඹු වන යටත් විජය ලක්ෂණ පහත පරිදි දැක්විය හැකිය.

- ස්තූපය නිරූපණයේ දී එහි එක් පසෙකින් බ්‍රිතාන්‍ය කොඩියක් දැක්වීම.
- බෝධියේ දෙපස දක්වා ඇති කොඩි දෙකෙන් එකක් බ්‍රිතාන්‍ය කොඩියක් වීම
- බෝධිය අසල බ්‍රිතාන්‍ය ආභාෂය සහිත පහණක් සිතුවම් කර තිබීම
- ලෙන් විහාරයේ වහලයේ හරිමැද සිතුවම්කර ඇති මෝස්තරයක අශ්වයෙක් පිට නැගි බ්‍රිතාන්‍ය සොල්දාදුවෙක් නිරූපණය කර තිබීම
- ථූපාරාමය, මිරිසවැටිය ආදී ලෙසින් නම් කර ඇති පැරණි ස්තූප නිරූපිත චිත්‍ර අතරමැද බ්‍රිතාන්‍ය ආභාශය සහිත පහන් කණු නිරූපණය කර තිබීම.
- එල්ලෙන ලාම්පු නිරූපණය කර තිබීම
- ලෙන් චිත්‍ර ගෘහයට ඇතුලුවන දොරකඩ උළුවස්සට උඩින් බ්‍රිතාන්‍ය රාජ්‍ය ලාංඡනය චිත්‍රයට නගා තිබීම
- හෙල්මට් පැලඳ ගත් සොල්දාදුවන් නිරූපණය කර තිබීම

- චිත්‍රවල තැනින් තැන අශ්වයන් හෝ අශ්ව රථ නිරූපණය කර තිබීම
- දේව රූපවල කරේ පැළඳි මාලයට කුරුස යොදා තිබීම.

**සමාලෝචනය**

විහාර බිත්තියේ එලියේ යටි තීරුවේ සිතුවම් හඳුනාගත නොහැකි ආකාරයට හායනය වී ඇති අතර බිත්තියේ බදාම තැනින් තැන ගැලවී වැටී ඇත. ඒවා නව ටික කලකින් දැකගත නොහැකි ලෙසම වියැකී යාමේ අවධානමක් තිබේ. එමෙන්ම බිත්ති සිතුවම් දිලිර නිසා විනාසයට පත්වෙමින් පවතින අතර මේ තතත්වය වියන් තලයේ සිතුවම්වලට ද දැඩි ලෙස බලපා තිබේ. ඉතාමත් පැරණි මෙන්ම අලංකාර සිතුවම් රාශියකින් හෙබි රක්ඛිතාකන්ද රජමහ විහාරයේ ප්‍රතිමාගෘහයේ සිතුවම් ඉතාමත් විනාශකාරී ලෙස හායනයට ලක්වන ආකාරය මෙම අධ්‍යනයේදී නිරීක්ෂණය කළ හැකිවිය. මේ නිසා මෙම සිතුවම් ආරක්ෂා කර ගැනීමට නිසි විද්‍යාත්මක සංරක්ෂණයක අවශ්‍යතාව දැඩිව පවත්නා අතර ඒ පිළිබඳ ව වගකිවයුතු ආයතන හා බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුම කාලය පැමිණ ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


සෝමතිලක, එම්. (2006)*ශ්‍රී ලාංකේය සිත්තරු සහ සමාජය.*කොළඹ:එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

බීනරගම, ඩී. (2008)*මහනුවර යුගයේ බෞද්ධ කලා සම්ප්‍රදාය.* කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.